2024

වාර්ෂික කාර්ය සාධන වාර්තාව
ஆண்டிறுதி செயலாற்றுகை அறிக்கை
Annual Performance Report

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව
சட்ட வரைஞர் திணைக்களம்
Legal Draftsman's Department

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2024

වැය ශීර්ෂ අංකය 230

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව
අංක 80, අධිකරණ මාවත,
කොළඹ 12

2024 වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තාව

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය: 230

අන්තර්ගතය

පරිච්ඡේදය 01	-	ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය
පරිච්ඡේදය 02	-	ප්‍රගතිය හා ඉදිරි දැක්ම
පරිච්ඡේදය 03	-	වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය
පරිච්ඡේදය 04	-	කාර්ය සාධන දර්ශක
පරිච්ඡේදය 05	-	තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය
පරිච්ඡේදය 06	-	මානව සම්පත් පැතිකඩ
පරිච්ඡේදය 07	-	අනුකූලතා වාර්තාව

01 පරිච්ඡේදය -ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.3 ප්‍රධාන කාර්යයන්

1.4 සංවිධාන සටහන

1.1 හැඳින්වීම

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව “ඒ” ශ්‍රේණියේ රාජ්‍ය දෙපාර්තමේන්තුවකි. අමාත්‍යාංශ විෂයයන් හා කාර්යයන් පිළිබඳ අංක 2187/27 හා 2020.08.09 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය අනුවඅධිකරණ අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ කටයුතු කරයි.

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කාර්යභාරය වනුයේ, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද තීරණ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව, විවිධ විෂයයන් පිළිබඳ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ලිඛිත නීති බවට පරිවර්තනය කිරීම වේ. එසේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති නීතිය බවට පරිවර්තනය කිරීමේ කාර්යාවලියේදී, දෙපාර්තමේන්තුව විසින්, නව නීති පැනවීම සඳහා පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම, පවත්නා නීති සංශෝධනය කිරීමේ පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම සහ ආණ්ඩුවේ විවිධ අමාත්‍යාංශවලින් ඉදිරිපත් කරන උපකාරක නීති ප්‍රතිශෝධනය කිරීම සිදුකරයි. පනත් කෙටුම්පත් සමාලෝචනය කිරීම සඳහා වන පාර්ලිමේන්තු තේරීම් කාරක සභා රැස්වීම්වලට සහභාගීවීම සහ පනත් කෙටුම්පත් විවාදයට ගැනීමේදී පාර්ලිමේන්තුව සමග සම්බන්ධීකරණය පවත්වා ගනිමින් අවශ්‍ය කටයුතු කිරීම දෙපාර්තමේන්තුවට පැවරී ඇති අනෙකුත් රාජකාරි කටයුතු වේ. මෙම දෙපාර්තමේන්තුව, සියලු රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ද ඇතුළුව ආණ්ඩුවේ සියලු අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත සේවා සලසයි. පනත් කෙටුම්පත් සහ උපකාරක නීති සැකසීම සම්බන්ධයෙන් නොයෙකුත් ආණ්ඩුවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට නෛතික උපදෙස් ලබාදීම ද, දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

1.2

දැක්ම

යහපත් රාජ්‍ය පාලනයක් ඇති කිරීම සඳහා, ආණ්ඩුවේ නොයෙකුත් ප්‍රතිපත්ති නීතිය බවට පරිවර්තනය කරමින් ශ්‍රී ලංකා ජනරජයට සහාය වීම

මෙහෙවර

ආණ්ඩුවේ ප්‍රතිපත්ති නීතිය බවට පරිවර්තනය කිරීමේ දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව ඊට අදාළ පනත් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුනෙන් සම්පාදනය කිරීම

1.3 පනත් කෙටුම්පත් සම්පාදනය කිරීමට අදාළව දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කර්තව්‍ය වනුයේ:-

(1)නව නීති පැනවීම සඳහා ද පවත්නා නීති සංශෝධනය කිරීම සඳහා ද භාෂාත්‍රයෙන් පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම;

(2)උපකාරක නීති භාෂාත්‍රයෙන් ප්‍රතිශෝධනය කිරීම සහ (අවශ්‍ය අවස්ථාවලදී)උපකාරක නීති කෙටුම්පත් කිරීම;

(3)නීති සම්පාදනය හා සම්බන්ධ පාර්ලිමේන්තු රාජකාරි ඉටු කිරීම;

(4)අවශ්‍ය අවස්ථාවල දී පළාත් සභා සඳහා ප්‍රඥප්ති කෙටුම්පත් කිරීම;

(5)පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත් (සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත්) භාෂාත්‍රයෙන් ප්‍රතිශෝධනය කිරීම;

(6)අමාත්‍ය මණ්ඩලයේ අනුමතය මත යෝජිත නීති පිළිබඳ කමිටු සඳහා සහභාගි වීම.

පනත්, උපකාරක නීති, සහ පළාත් සභා ප්‍රඥප්ති කෙටුම්පත් කිරීමේදී ඒ සම්බන්ධව අවශ්‍ය වන නෛතික උපදෙස් ලබා දීම ද මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබේ.

මෙම දෙපාර්තමේන්තුවේ විශේෂ ලක්ෂණය වන්නේ, එයටම සීමා වූ වැඩසටහනක් නොතිබීම යි. අමාත්‍ය මණ්ඩලය විසින් නියමිත ප්‍රතිපත්ති අනුමත කිරීමෙන් පසුව, ආණ්ඩුවේ අමාත්‍යාංශවල හා එම අමාත්‍යාංශ යටතේ ඇති විවිධ දෙපාර්තමේන්තුවල ව්‍යවස්ථා සම්පාදන අවශ්‍යතා මත දෙපාර්තමේන්තුවේ වැඩසටහන සකස් වීම ඊට හේතුවයි. එබැවින් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය, යම් නිශ්චිත වර්ෂයක් මුළුල්ලේ මූලික නීති, නීති සංශෝධන හා උපකාරක නීති සම්බන්ධයෙන් අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හා එම ඉල්ලීම් සාර්ථකව නිම කිරීම යන පදනම මත සකස් වී ඇත. දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරය වන නීති සම්පාදනයෙහි විෂය පථයට ඇතුළත් වන කවර ආකාරයක හෝ වූ නීති, එය ඉල්ලා සිටින අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට මුද්‍රා හැරීමට පෙර භාෂා තුනෙන් ම සම්පූර්ණ කරනු ලැබිය යුතු ය.

1.4 සංවිධාන සටහන



*කළමනාකරණ සේවා නිලධාරී - 20

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2024 කාර්ය සාධන වාර්තාව - 2024.01.01-2024.12.31

	(1)	(2)	(3)	(4)	(5)	(6)	(7)	(8)	* (9)		(10)	*(11)	(12)
	රාජකාරියේ ස්වභාවය	2024.01.01දිනට කෙටුම්පත් කර මූලික හෝ අවසන් කෙටුම්පත් වශයෙන් භාරදී නීතිපති හෝ අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් නිරීක්ෂණ හා උපදෙස් බලාපොරොත්තුවෙන් ඉතිරිව පවතින ඉල්ලීම් සංඛ්‍යාව (ඉදිරියට ගෙනා ශේෂය)	2024.01.01 දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් සංඛ්‍යාව (ඉදිරියට ගෙනා ශේෂය)	මෙම වර්ෂය තුළ පාර්ශවයන් වෙතින් ලැබුණු නව ඉල්ලීම් සංඛ්‍යාව	පසුගිය වර්ෂ වල හා මෙම වර්ෂයේදී භාෂාත්‍රයෙන් කෙටුම්පත් කර අවසන් කර එහෙත් නැවත වරක් සංශෝධන සිදුකිරීම සඳහා ලද ඉල්ලීම් සංඛ්‍යාව	එකතුව (2+3+4+5)	2024.12.31 දිනට කෙටුම්පත් සකස් කර භාෂාත්‍රයෙන් අදාළ පාර්ශවයන් වෙත ලබා දුන් සංඛ්‍යාව (කිසියම්වරක් භාෂාත්‍රයෙන් සකස් කර අදාළ පාර්ශවයන් වෙත භාරදුන් අවසන් කෙටුම්පත්වල ඒ ඒ වාරයන් සියල්ලම මෙහි ඇතුළත් වේ.)	දීර්ඝ කාලීනව උපදෙස් නොමැතිව වසා ලද ගොනු	2024.12.31දිනට කෙටුම්පත් කර මූලික හෝ අවසන් කෙටුම්පත් වශයෙන් හෝ භාරදී නීතිපති හෝ අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු හා වෙතින් නිරීක්ෂණ හා උපදෙස් බලාපොරොත්තුවෙන් ඉතිරිව පවතින ඉල්ලීම් සංඛ්‍යාව		එකතුව (7+8+9)	2024.12.31 දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් සංඛ්‍යාව	ප්‍රගතිය (ප්‍රතිශතයක් % වශයෙන්) (10/6*100)
									**නීතිපති	අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු			
1 .	පනත් කෙටුම්පත් කිරීම (මූලික හා සංශෝධන නීති)	**132**	**29**	**82**	**7**	**250**	**60**	**25**	**1**	**161**	**247**	**3**	**99%**
2	පෞද්ගලිකමන්ත්‍රී (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත්	**33**	**9**	**13**	**2**	**57**	**8**	**49**	**00**		**57**	**00**	
3	උපකාරක නීති ප්‍රතිශෝධනය	**113**	**58**	**149**	**10**	**330**	**124**	**17**	**147**		**288**	**42**	**87%**
4	පළාත් සභා ප්‍රඥප්ති	**11**	**0**	**0**	**0**	**11**	**0**	**4**	**7**		**11**	**0**	**100%**
	එකතුව	**289**	**96**	**244**	**19**	**648**	**192**	**95**	**316**		**603**	**45**	**93%**

* 9, 10 තීරුවලට අදාළ පැහැදිලි කිරීම් පසුපිටේ දක්වා ඇත.

** මෙම දෙපාර්තමේන්තුව විසින් සෘජුවම නීතිපතිවරයා වෙත යොමු කරනු ලබන්නේ මූලික හා සංශෝධන පනත් කෙටුම්පත් පමණි.

<u>*පැහැදිලි කිරීම</u>

<u>වගුවේ තීරු අංක (9) - කෙටුම්පත්කර මූලික හෝ අවසන් කෙටුම්පත් වශයෙන් භාර දී නීතිපති හෝ අනෙකුත් අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු වෙතින් නිරීක්ෂණ හා උපදෙස් බලාපොරොත්තුවෙන් ඉතිරිව පවතින ඉල්ලීම් සංඛ්‍යාව සහ (11) - කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් සංඛ්‍යාව</u>

මෙම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීම් අතරින් සම්පූර්ණ කරනු ලැබ කෙටුම්පත් යවනු ලැබුවා වූ බොහෝමයක් ඉල්ලීම් ද, ප්‍රධාන වශයෙන් උපදෙස් ලබාදෙනු ලබන නියෝජ්‍යායතන විසින් සිය ප්‍රතිපත්තිය නිරන්තරයෙන් වෙනස් කිරීමේ හේතුව මත, එසේ සම්පූර්ණ කොට තිබුණ ද තවදුරටත් සංශෝධනය කිරීම සඳහා අලුත් උපදෙස් ද සමඟ ඉදිරිපත් කරනු ලැබේ. එවැනි ඉල්ලීමක් ලැබුණ විට එම ඉල්ලීමට අදාළ කෙටුම්පත අවසාන වශයෙන් සකස් කර තිබුණ ද එය නොසලකා අලුතින් සිදු කරනු ලබන ඉල්ලීමක් මෙන් එම ඉල්ලීම පිළිබඳව නැවත අවධානය යොමු කිරීමට හා ඒ සඳහා කාලය වැය කිරීමට මෙම දෙපාර්තමේන්තුවට සිදු වේ. සම්පූර්ණ කරන ලද කෙටුම්පත් සඳහා එවැනි සංශෝධන සිදු කිරීමට කරනු ලබන ඉල්ලීම් අවසාන කෙටුම්පත භාෂාත්‍රයෙන් යවනු ලැබීමෙන් පසුවද සිදු කරනු ලබන අතර, ඇතැම්විට ඉහත කී කාර්යපටිපාටිය නැවත නැවතත් වාර ගණනාවක්ම ඉටු කිරීමට සිදු වේ. ඒ සඳහා නිදසුන් කිහිපයක් පහත ඉදිරිපත් කර ඇත.

පනත් කෙටුම්පතේ නම	කෙටුම්පත් කර යවා ඇති වාර ගණන (2024.12.31 දිනට)
සත්ව සුබසාධන පනත්කෙටුම්පත	21
ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය පනත්කෙටුම්පත	24
ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත	09

එහෙයින්, මෙම දෙපාර්තමේන්තුව විසින් යම් ඉල්ලීමක් සඳහා අවධානය යොමු කර එය සම්පූර්ණ කර තිබුණද, ඉහත දක්වා ඇති හේතුව මත එම ඉල්ලීම තවදුරටත් මෙම දෙපාර්තමේන්තුව විසින් "කෙටුම්පත් කර අවසන් නොවූ ඉල්ලීමක්" වශයෙන් පිළිඹිබු වේ. ඒ අනුව,

1.පනත් කෙටුම්පත් (මූලික හා සංශෝධන නීති)

කෙටුම්පත් කිරීම අවසන් නොවූ පනත් කෙටුම්පත් සම්බන්ධ අමාත්‍ය මණ්ඩල තීරණ මීට පෙර පැවති අමාත්‍ය මණ්ඩලය යටතේ ලබාගත් හෙයින් නව අමාත්‍ය මණ්ඩලය යටතේ එම ගොනු සම්බන්ධව තවදුරටත් කටයුතු කරන්නේද යන්න විමසමින් අදාළ අමාත්‍යාංශ වෙත ලිපි යොමු කර පිළිතුරු අපේක්ෂාවෙන් සිටී.

2.පෞද්ගලික මන්ත්‍රී (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත්

2024.09.25 වන දින පාර්ලිමේන්තුව විසුරුවා හැරීම හේතුවෙන් පෞද්ගලික මන්ත්‍රී (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත් සම්බන්ධ ඉල්ලීම් කල් ඉකුත් වන බැවින් අප දෙපාර්තමේන්තුවට එම පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් තවදුරටත් කටයුතු කිරීමේ හැකියාවක් නොමැති බැවින් එම ගොනු වසා දැමීමට කටයුතු කරන ලදී.

3.උපකාරක නීති ප්‍රතිශෝධනය

ප්‍රතිශෝධනය කිරීම අවසන් නොවූ උපකාරක නීති සම්බන්ධ ඉල්ලීම් 42 කි. මේවා 2024.12.31 දින හෝ ඊට ආසන්න දිනක ලැබූ ඉල්ලීම් හෝ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හෝ ආයතනවල උපදෙස් හෝ නිරීක්ෂණ 2024.12.31 දින හෝ ඊට ආසන්න දිනක ලැබී ඇති හෝ තවමත් සාකච්ඡා මට්ටමින් පවතින හෝ ඒවා වේ.

4.පළාත් සභා ප්‍රඥප්ති

පළාත් සභා ප්‍රඥප්ති සම්බන්ධයෙන් ප්‍රතිශෝධන කෙටුම්පත් (ඉංග්‍රීසි/සිංහල/දෙමළ) අදාළ පළාත් සභා වෙත යොමු කර ඇත. තවද, එලෙස යවන ලද කෙටුම්පත්වලට අදාළ පළාත් සභා වෙතින් නිරීක්ෂණ බලාපොරොත්තුවෙන් පවතින ගොනු 7කි. කෙසේ වුවත් දැනට පළාත් සභා ක්‍රියාත්මක නොවන බැවින්, අදාළ පළාත් අමාත්‍යාංශ යනාදියෙන් අදාල ගොනුවල ඉදිරි කටයුතු සිදුකරගෙන යන්නේද යන්න සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා ලිපි යොමු කිරීමෙන් අනතුරුව ගොනු කිහිපයක් තවදුරටත් ඉදිරියට පවත්වාගෙන යා යුතු බවට අදාළ පළාත් සභා වෙතින් දැනුම් දී ඇති බැවින් එම ගොනු විවෘතව තබා ගැනීමට සිදුව ඇත.

විශේෂ ජයග්‍රහණ

පැවරෙන කාර්ය භාරය හා විෂයය පථය පුළුල් වුවද, මෙම කාර්යභාරය ඉටු කිරීම සඳහා දෙපාර්තමේන්තුව සතුව ඇත්තේ සාපේක්ෂව අඩු කාර්ය මණ්ඩලයකි. පවතින කාර්ය මණ්ඩලයේ වුවද පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් ඇති බැවින්, එවැනි ගැටළු මධ්‍යයේ වුව ද දෙපාර්තමේන්තුව වෙත පැවරෙන කාර්යයන් සාර්ථකව සහ සඵලදායී අන්දමට ඉටු කිරීමට හැකිවීම මෙම දෙපාර්තමේන්තුව ලද විශේෂ ජයග්‍රහණයකි.

අභියෝග

1. ආයතන සංග්‍රහයේ XXXIII පරිච්ඡේදයේ 2.2 ඡේදය ප්‍රකාරව, "*රජයේ නීති සම්පාදන වැඩසටහන හා සම්මත කිරීම සඳහා එම පනත් ඉදිරිපත් කරන ප්‍රමුඛතා පිළිවෙල අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලැබූ පසුව අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා එම අමාත්‍ය මණ්ඩල තීරණ ඒ ඒ ලේකම්වරයාට හා නීති කෙටුම්පත් සම්පාදකට ඔවුන්ගේ දැනගැනීම සඳහා දන්වා යවනු ඇත*". කෙසේ වුවත් ඉහත නිශ්චිතව දක්වා ඇති පරිදි ප්‍රමුඛතා පිළිවෙල සම්බන්ධ සන්නිවේදනය කිරීමක් මේ දක්වා සිදු වී නොමැති අතර, එය අමාත්‍ය මණ්ඩලයේ මග පෙන්වීමකින් තොරව රජයේ නීති වැඩසටහනෙහි නීති සම්පාදනය සම්බන්ධ ප්‍රමුඛතා පිළිවෙල හඳුනා ගැනීම දෙපාර්තමේන්තුව වෙත අභියෝගයක් බවට පත් කර ඇත.

2. ආයතන සංග්‍රහයේ XXXIII පරිච්ඡේදයේ 2.1 ඡේදය ප්‍රකාරව, *"නීති කෙටුම්පතක් සකස් කොට එවන ලෙස ඉල්ලා සිටින සෑම අවස්ථාවකදීම, කෙටුම්පත් සකස් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදකට මඟ පෙන්වනු පිණිස ඒ පිළිබඳ හැකි තරම් සම්පූර්ණ උපදෙස් අඩංගු සංදේශයක් ද එවැනි ඉල්ලීමක් සමග යැවිය යුතු ය"*. කෙසේ වුවද, පසුගිය වසර කිහිපය තුළ දී, විවිධ රැස්වීම් වලදී, නීති කෙටුම්පත් සම්පාදක වෙත නීති කෙටුම්පත් කිරීම සඳහා සහ නීති සංශෝධනය කිරීම සඳහා වාචික උපදෙස් ලබාදීමේ පරිචයක් ක්‍රමයෙන් වර්ධනය වී ඇත. අතිශයින්ම හදිසි නීති සම්පාදනය කිරීමේ දී එවැනි පරිචයක් අනුගමනය කළ හැකි වුවද, දෙපාර්තමේන්තුව තුල රාජකාරි වාර්තා පවත්වාගෙන යාමේ දුෂ්කරතාව, එවැනි රැස්වීම්වල සිදුවන සාකච්ඡා අතරතුර පැහැදිලි හා අවසන් උපදෙස් නොලැබීම සහ එමගින් දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද කෙටුම්පත්වල ව්‍යාකූලතා නිර්මාණය වීම වැනි ප්‍රතිවිපාක ඇතිවිය හැකි බැවින් වාචික උපදෙස් ලබාදීම සාමාන්‍ය පරිචයක් වීම දෙපාර්තමේන්තුව වෙත අභියෝගයක් බවට පත්ව තිබේ.

3. මෑතකදී පළපුරුදු ජ්‍යෙෂ්ඨ නීති කෙටුම්පත් සම්පාදක නිලධරයන් රැසක් සේවයෙන් විශ්‍රාම ගෙන තිබීම ජ්‍යෙෂ්ඨ ගණයේ තනතුරු සහ කණිෂ්ඨ ගණයේ තනතුරුවල නිලධරයන් සංඛ්‍යාව අතර අසමතුලිතභාවයක් නිර්මාණය කර ඇති අතර, උසස් තත්ත්වයේ නීති සම්පාදන කාර්යයක් සිදු කිරීම

පිණිස වසර ගණනාවක පුළුල් දැනුමක් සහ අත්දැකීම් අවශ්‍ය බැවින් අවම පළපුරුද්දක් සහිත නිලධරයන් බහුතර සංඛ්‍යාවක් සමඟ දෙපාර්තමේන්තුවේ ඉලක්ක සපුරා ගැනීම අභියෝගයක් බවට පත්ව තිබේ.

4. දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාවෙන් 62 ක් පුරප්පාඩුව පවතින අතර, අනුමත සේවක සංඛ්‍යාවෙන් 1/3 කට වඩා පුරප්පාඩුව තිබියදී දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය පවත්වාගෙන යාමද අභියෝගයක් වී ඇත. පුරප්පාඩු පිරවීම සඳහා පියවර ගෙන තිබුණද ඒ සඳහා අනුගමනය කරනු ලැබිය යුතු ක්‍රියාවලිය සඳහා විශාල කාලයක් ගත වේ.

5. දෙපාර්තමේන්තුව සඳහා නව බඳවා ගැනීම් සිදු කරනු ලැබුවද බොහොමයක් තනතුරුවල සිටින නිලධරයන් විසින් ඉටු කරනු ලබන අධික වැඩ ප්‍රමාණය සහ රාජකාරියේ වැදගත්කම හා සංසන්දනය කිරීමේදී එම තනතුරු සඳහා ගෙවනු ලබන පාරිශ්‍රමික තෘප්තිමත් මට්ටමක නොපැවතීම හේතුවෙන් එලෙස අලුතින් බඳවාගත් තැනැත්තන් සැලකිය යුතු කාල පරාසයක් සඳහා දෙපාර්තමේන්තුව තුල රඳවා තබා ගැනීම අභියෝගයක් බවට පත් වී ඇත.

<u>ඉදිරි ඉලක්ක</u>

(1) ඉහත නිශ්චිත වශයෙන් සඳහන් කරන ලද අභියෝග ජය ගැනීම සඳහා ක්‍රම සහ විධි සොයා ගැනීම කාලීන අවශ්‍යතාවයක්ව ඇති හෙයින්, 2021 වර්ෂයේ දී, අතිගරු ජනාධිපතිවරයාගේ ලේකම්වරයා සහ අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා සමඟ සාකච්ඡා කිහිපයක් පැවතුණි. එකී සාකච්ඡාවන්හි ප්‍රතිඵලයක් වශයෙන් අධිකරණ අමාත්‍යවරයා විසින් දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා වන යෝජනා ඇතුළත් කරමින් අංක 2021/Cab/Memo/J/ADM/124 දරන සහ 2021.12.15 වන දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. අමාත්‍ය මණ්ඩලය විසින් ජාතික වැටුප් කොමිෂන් සභාව වෙත නිකුත් කරන ලද විධාන මත එකී කොමිෂන් සභාව විසින් දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව වැඩි කිරීම සඳහා නිර්දේශ නිකුත් කරන ලදී. ඉන් අනතුරුව, 2023.03.27දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය බලාත්මක කරමින්, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමට අදාල යොජනා ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත් කිරීමට යෝජනා කරමින් අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද අංක 2023/Cab/Memo/J/ADM/53 සහ 2023.04.28 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට 2023.05.10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමතය ලැබී ඇත.

අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ තීරණය, 2023.05.16 දිනැති ලිපිය මගින් නීති කෙටුම්පත් සම්පාදකතුමිය වෙත දැන් වූ අතර ඒ අනුව, 2023.05.08 වන දින කමිටුවක් පත් කරන ලදී. රැස්වීම් කිහිපයක් පැවැත්වීමෙන් අනතුරුව, කමිටුව විසින් එහි අවසන් වාර්තාව 2023.08.16 වන දින අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ අතර, ඒ වාර්තාව පිළිබඳ අමාත්‍ය මණ්ඩලයේ තීරණය, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2023.09.20 වන දිනැති ලිපිය මගින් නීති කෙටුම්පත් සම්පාදක වෙත සන්නිවේදනය කරන ලදී.

ඒ අනුව, කඩිනමින් බලාත්මක කරනු ලැබිය හැකි කමිටුවේ ඇතැම් නිර්දේශ බලාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇති අතර, බලාත්මක කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ පවතින ඉතා අවම මානව හා භෞතික සම්පත් සඵලදායීව උපයෝගී කර ගනිමින් කමිටුවේ නිර්දේශ නිර්දේශ පියවරෙන් පියවර ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත.

දෙපාර්තමේන්තුවේ නීති නිලධාරීන්ගේ සමස්ත සංඛ්‍යාව ඉහළ නැංවීම සහ ජ්‍යෙෂ්ඨ නිලධාරී සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා ඉහත කමිටුවේ නිර්දේශයක් ලෙස ජ්‍යෙෂ්ඨ නීති කෙටුම්පත් සම්පාදක තනතුරු සංඛ්‍යාව 08 සිට 12 දක්වා සංශෝධනය කිරීමට කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය 2024.05.10 දිනැති ලිපිය මගින් ලබා දී ඇත. ඒ අනුව එම තනතුර සඳහා උසස්වීම් ලබා දීමට කටයුතු කරමින් පවතී.

එසේම එම කමිටු නිර්දේශ අනුව දෙපාර්තමේන්තුවේ පරිපාලන කාර්ය භාරය වඩා විධිමත්ව පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය මත අධ්‍යක්ෂ (පාලන) තනතුරක් ඇති කිරීමට යොමු කරන ලද ඉල්ලීම සඳහා ද කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය 2024.05.10 දිනැතිව ලබා දී ඇති අතර ඉතා කඩිනමින් ඒ සඳහා නිලධරයෙකු අනුයුක්ත කරවා ගෙන ඉතිරි කමිටු නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සැලසීමට නියමිතය.

කෙසේ වුව ද, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර තිබුණ ද, කමිටුවේ ඇතැම් නිර්දේශ, දෙපාර්තමේන්තුව විසින් මුහුණපාන ගැටලුවලට කාර්යක්ෂම අයුරින් ප්‍රායෝගික විසඳුම් ලබා දීමට අපොහොසත් වන බව සහ ඇතැම් නිර්දේශ බලාත්මක කළහොත් දීර්ඝ කාලයක් යන තුරු පිරවීමට අපහසු ජ්‍යෙෂ්ඨ සේවා ගණයේ තනතුරුවල හිඩැසක් ඇති කළ හැකි බව නිරීක්ෂණය වූ අතර, එම කාරණය 2023.11.15 දිනැති සහ 2024.01.19 දිනැති නීති කෙටුම්පත් සම්පාදකගේ ලිපි මගින් අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අවධානය සඳහා යොමු කරන ලදී.

ඒ අනුව නීති කෙටුම්පත් සම්පාදකගේ 2023.11.05 දිනැති සහ 2024.01.19 වන දිනැති ලිපි මගින් පෙන්වා දෙන ලද ගැටලු සලකා බලා දෙපාර්තමේන්තුව විසින් මුහුණපාන අභියෝග සඳහා වඩා ප්‍රායෝගික විසඳුම් හඳුනාගෙන, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීම

සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුවේ ඇතැම් නිර්දේශවල ප්‍රතිශෝධනය කිරීමක් දෙපාර්තමේන්තුව විසින් අපේක්ෂා කෙරේ.

(2) දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ඉහළ නැංවීමටල නීති කෙටුම්පත් සම්පාදක සේවය වෙත දක්ෂ, කාර්යක්ෂම සහ හැකියාවන්ගෙන් පිරිපුන් නිලධරයන් ආකර්ෂණය කර ගැනීම සඳහා ක්‍රම සහ විධි සෙවීම කාලීන සහ හදිසි අවශ්‍යතාවයක්ව ඇති හෙයින්, අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ගරු අමාත්‍යවරයා සමග සාකච්ඡා කිහිපයක් පැවැත්වීමෙන් අනතුරුව, දැනට නීතිපති දෙපාර්තමේන්තු නිලධාරී සේවයේ නිලධරයන්ට ගෙවනු ලබන ඇතැම් දීමනා, නීතිපති දෙපාර්තමේන්තු නිලධාරී සේවාවේ සමාන්තර ශ්‍රේණිවල නිලධරයන්ට ගෙවනු ලබන ප්‍රමාණයන්ට සමාන ප්‍රමාණයකින් නීති කෙටුම්පත් සම්පාදක සේවයේ නිලධරයන්ට ද ගෙවන ලෙසට වන යෝජනා ඇතුලත් අමාත්‍ය මණ්ඩල සංදේශයක් 2023.10.02 වන දින අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ගරු අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. මේ සම්බන්ධයෙන් 2024 වර්ෂයේ මුල් භාගයේදී ද අධිකරණ අමාත්‍යාංශය හා අප දෙපාර්තමේන්තුව අතර, සන්නිවේදනයන් සිදු වුවද අමාත්‍ය මණ්ඩලයේ තීරණය මේ වන තෙක් දැනුම් දී නොමැත. කෙසේ වුවද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුවේ යෝජනා මෙන්ම නව රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට හැකි වන සේ සිදු කළ යුතු නීති ප්‍රතිසංස්කරණ වෙනුවෙන් දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය දරන උත්සාහයෙහි හා කැපවීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් දෙපාර්තමේන්තුව විසින් දැනට ඉටු කරනු ලබන අති මහත් වූ කාර්ය භාරය සැලකිල්ලට ගනිමින් ඒ සඳහා සතුටුදායක ප්‍රතිචාරයක් ලබා දෙනු ඇතැයි දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි.

විගණන නිලධරයා/ දෙපාර්තමේන්තු ප්‍රධානියා :

නම :

තනතුර :

දිනය :

දිල්රුක්ෂි සමරවීර
ජනාධිපති නීතිඥ,
නීති කෙටුම්පත් සම්පාදක,
නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව,
අංක. 80, අධිකරණ මාවත,
කොළඹ 12.

03 පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු.		සටහන	තත්‍ය 2024 රු.	තත්‍ය 2023 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	ඒසීඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	ඒසීඒ-1
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		157,148,000	137,847,000	ඒසීඒ-3
-	තැන්පතු		974,740	584,314	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		4,982,650	6,474,230	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**163,105,390**	**144,905,544**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**163,105,390**	**144,905,544**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		441,317		
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		**162,664,073**	**144,905,544**	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
109,228,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	99,489,848	86,349,025	ඒසීඒ-2(ii)
61,082,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	53,689,512	49,012,137	ඒසීඒ-2(ii)
450,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	430,040	506,002	ඒසීඒ-2(ii)
-	පොළී ගෙවීම්	8	-	-	ඒසීඒ-2(ii)
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	ඒසීඒ-2(ii)
170,760,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**153,609,400**	**135,867,164**	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	-	-	ඒසීඒ-2(ii)
1,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	996,711	58,616	ඒසීඒ-2(ii)
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	ඒසීඒ-2(ii)
4,000,000	හැකියා වර්ධනය	14	999,501	1,858,657	ඒසීඒ-2(ii)
-	වෙනත් මූලධන වියදම්	15	-	-	ඒසීඒ-2(ii)
5,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**1,996,212**	**1,917,273**	
	තැන්පතු ගෙවීම්		564,050	522,004	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		5,200,990	4,351,884	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**5,765,040**	**4,873,888**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		161,370,652	142,658,325	
175,760,000	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		1,293,421	2,247,219	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		**1,293,421**	**2,247,219**	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසීඒ-3
			-	-	

28 FEB

1

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය 2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	101,276,846.00	100,325,237.00
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	10,091,554.00	9,873,214.00
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**111,368,400.00**	**110,198,451.00**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		9,618,554.00	9,810,904.00
දේපළ පිරියත හා උපකරණ සංචිතය		101,276,846.00	100,325,237.00
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	473,000.00	62,310.00
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**111,368,400.00**	**110,198,451.00**

පිටු අංක 07 සිට 24 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 25 සිට 46 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

....	....	....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන ගණකාධිකාරි
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	තනතුර :
දිනය : 28/02/2025	දිනය : 2025.02.24	දිනය : 2025.02.21
ජනාධිපති නීතිඥ අයෙෂා ජිනසේන ලේකම් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10.	දිල්රුක්ෂි සමරවීර ජනාධිපති නීතිඥ, නීති කෙටුම්පත් සම්පාදක, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව, අංක. 80, අධිකරණ මාවත, කොළඹ 12.	ඒ. එම්. පී. නිලන්ති ප්‍රධාන ගණකාධිකාරී නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව කොළඹ 12

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	කතාය	
	2024 රු.	**2023** රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්		
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	4,581,768	5,439,377
අග්‍රිම ලැබීම්	157,148,000	137,847,000
අත්තිකාරම් අයකර ගැනීම්	5,201,647	5,127,320
තැන්පතු ලැබීම්	974,740	584,314
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**167,906,155**	**148,998,011**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	152,841,955	135,234,588
සහනාධාර සහ මාරුකිරීම්	430,040	506,002
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	6,546,251	6,466,260
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	441,317	-
අත්තිකාරම් ගෙවීම්	5,114,190	4,351,884
තැන්පතු ගෙවීම්	564,050	522,004
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**165,937,803**	**147,080,738**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**1,968,352**	**1,917,273**
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	27,860	
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**27,860**	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
මූලධන වියදම්	1,996,212	1,917,273
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**1,996,212**	**1,917,273**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(1,968,352)**	**(1,917,273)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)		-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

<u>වාර්තා කිරීමේ පදනම</u>

1) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩි දියුණු කර ඇත.අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩි දියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනා ගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) <u>දේපළ, පිරියතහාඋපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2024 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි වලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
අදාළ නොවේ					

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය.

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් ප්‍රතිපාදන ප්‍රමාණයේ ප්‍රතිශතයක්(%) ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසන් ප්‍රතිපාදනය		
පුනරාවර්තන වියදම්	161,400	170,760	153,609.39	89.96%
ප්‍රාග්ධන වියදම්	5,000	5,000	1,996.21	39.92%

3.8 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන.

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදනය ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් ප්‍රතිපාදන ප්‍රමාණයේ ප්‍රතිශතයක්(%) ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		
01.	නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව	ජල, විදුලි බිල්පත් ගෙවීම	2,500	3,275	2,929.80	89.46%

	නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව	ආරක්ෂක බිල්පත් ගෙවීම	500	973	924.12	94.98%
	නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව	අභ්‍යන්තර දුරකථන නඩත්තු ගෙවීම	43.01	71.63	71.63	100%
02.	ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය	ජල,විදුලි හා ආරක්ෂක බිල්පත් ගෙවීම	2,140	2,855	2,620.68	91.79%

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2024 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2024 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152 - 2.1	වාහන	59,495,000.00	59,495,000.00	-	100%
9152-2-2	යන්ත්‍රෝපකරණ	41,781,846.00	41,781,846.00	-	100%
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කරමින් පවතින වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No.	JLO/B/LDD/FA/2024/08	ඔබේ අංකය உமது இல. Your No.	දිනය திகதி Date — 2025 මැයි 30 දින

නීති කෙටුම්පත් සම්පාදක

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

ශීර්ෂය 230 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 230 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණුකර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ

සඵලදායිත්වය පිළිබඳව කළින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරි දැනුවත් කරමි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මකකර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මකකර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
2.4 (ආ)	වාහන සම්බන්ධයෙන් ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාව සිදුකර නොතිබුණි.	3.3 (ඇ)

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

ප්‍රමාණවත් පරිදි වාර්ෂික ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන වෙන්කර නොගැනීම නිසා පුනරාවර්තන වැය විෂයයන් 03ක් සහ එක් මූලධන වැය විෂයයක් සඳහා ශුද්ධ ප්‍රතිපාදන රු.57,860,000කින් රු.12,849,279ක් ඉතිරිව තිබූ අතර, එම ඉතිරිවීම් සියයට 15 සිට සියයට 81 දක්වා පරාසයක් ගෙන තිබුණි.

3.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ගණන්දීමේ නිලධාරි විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරි විසින් පහත සඳහන් කරුණ සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතුකර නොතිබුණි.

අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසිපරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි.

3.3 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීතිරීති හා රෙගුලාසිවලට යොමුව		අනුකූල නොවීම
(අ)	2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 9.1හි මුදල් රෙගුලාසි අංක 371(2)(අ)	සුළු මුදල් අතුරු අග්‍රිමයෙන් එක්වරකදී එක් අවශ්‍යතාවයකට ගෙවිය හැකි උපරිම සීමාව රු.5,000 නොඉක්මවිය යුතු වුව ද, 2024 මාර්තු 04 දින අංක 03/12 දරන සුළු මුදල් වවුචරයෙන් රු.5,700ක් වටිනා pen drive 2ක් මිලදීගෙන තිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
	i. 156(5)	යම් කිසි වරදක් නිවැරදි කිරීමට අවශ්‍ය වූ විට එම වරද නිවැරදි කළ යුත්තේ වෙනස් කළ යුතු නොහොත් ඉවත් කළ යුතු වචන ඉලක්කම් ආදිය තනි ඉරකින් කපා දමා අවශ්‍ය තැන්හි එවැනි වෙනස් කිරීම්වලට ඉහළින් නිවැරදි ඉලක්කම් ආදිය රතු තීන්තෙන් ලිවීමෙනි. එකී නිවැරදි කිරීම් සඳහා වගකිවයුතු නිලධාරියා සිය කෙටිසන යෙදීමෙන් අදාළ වෙනස් කිරීම හා කපාහැරීම සහතික කළ යුතු රු.1,446,417 ගෙවීම්වලට අදාළව එසේ සිදුකර නොතිබුණි.
	ii. 237(ආ)	ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කිරීමේදී භාණ්ඩ ලැබී ඇති බවට ද අදාළ බඩු ලේඛනයෙහි, තොග පොත යනාදියෙහි එකී භාණ්ඩ ඇතුළත්කර ඇති බවට ද සහතිකයක් ඇමිණිය යුතු වුවත්, රු.13,900ක මිලදීගැනීම්වලට අදාළව එසේ සිදුකර නොතිබුණි.
	iii. 262 (2)	වරක් ගෙවූ වවුචර් නැවත වරක් ගෙවීම සඳහා ඉදිරිපත් කිරීමේ අවධානමක් ඇති

		බැවින්, ගෙවන ලද සියලුම වවුචර්වලත්, ඒවා තහවුරු කරන ලියවිලිවලත් මතුපිට "ගෙවන ලදී" මුද්‍රාව යෙදිය යුතු වුවත්, රු.33,235ක වටිනාකමකින් යුත් සුළු මුදල් වවුචර් සම්බන්ධයෙන් එසේ සිදුකර නොතිබුණි.
	iv. 1646	ගමන් පිළිබඳ මාසික සාරාංශය වාහන භාර නිලධාරින් විසින් වාර්තාව ඉදිරිපත් කරනු ලබන මාසයට පසු ඊළඟ මාසයේ 15 වැනි දින ගතවන්නට ප්‍රථමයෙන් 268 (අ) වැනි පොදු ආකෘතිපත්‍රයෙහි ලියන ලද ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපත ද සමඟ ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් විගණකාධිපති වෙත යැවිය යුතු වුවත්, වාහන 12කට අදාළව එසේ කටයුතු සිදුකර නොතිබුණි.
(ඇ)	2016.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 හි 3.1 ඡේදය	සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12ක කාලසීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත් ආයතනයේ වාහන 03ක් සඳහා ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබානොගැනීම

දෙපාර්තමේන්තුව විසින් 2024 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත්කර ඇති කාර්යසාධන වාර්තාව අනුව 2024 ජනවාරි 01 දිනට කෙටුම්පත්කර මූලික හෝ අවසන් කෙටුම්පත් වශයෙන් භාරදී නීතිපති හෝ අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් නිරීක්ෂණ හා උපදෙස් බලාපොරොත්තුවෙන් ඉතිරිව පවතින ඉල්ලීම් 289ක් සහ

2024 ජනවාරි 01 දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් 96ක් වූ මුළු ඉල්ලීම් 385න් දීර්ඝ කාලීනව උපදෙස් නොමැතිව වසන ලද ගොනු 95ක් පැවති අතර, 2024 දෙසැම්බර් 31 දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් 45ක ප්‍රමාණයක් ඉතිරි වී පැවතුණි.

4.1.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 හි 12.2 ඡේදය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස්කළ යුතු වුවත්, මෙම දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද කාර්යසාධන වාර්තාව තුළ ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය, ප්‍රගතිය හා ඉදිරි දැක්ම, තිරසර සංවර්ධනය අරමුණු (SDG) සපුරාගැනීමේ කාර්යසාධනය, මානව සම්පත් පැතිකඩ යන පරිච්ඡේදයන් ඇතුළත්කර නොතිබුණි.

4.2 ප්‍රසම්පාදනයන්

2024 වර්ෂය සඳහා භාණ්ඩ මිලදීගැනීමට රුපියල් මිලියනයක ඇස්තමේන්තුවක් ඇතුළත් කොට ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර තිබුණ ද, ප්‍රසම්පාදන සැලසුම අනුව ප්‍රසම්පාදනයන් 03ක් අවසන් කළ යුතු දිනය වන 2024 මැයි 30 දින වන විට එම ප්‍රසම්පාදනයන් අවසන්කර නොතිබූ අතර දින 52 - දින 83ක කාලපමාවක් තිබුණි.

4.3 කළමනාකරණ දුර්වලතා

සියලු නිලධාරින්ගේ රාජකාරී ලැයිස්තු ඉල්ලා තිබුණ ද, එය විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අංක 40(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ගැනීමට කටයුතුකර නොතිබුණු අතර, අභ්‍යන්තර විගණක තනතුරක් ද, අනුමතකර ගෙන නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්යමණ්ඩලය, තථ්‍ය කාර්යමණ්ඩලය

(අ) 2024 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යමණ්ඩලය 154ක් ද, තථ්‍ය කාර්යමණ්ඩලය 92ක් ද වූ අතර, පුරප්පාඩු කාර්යමණ්ඩලය 62ක් විය. ඒ අනුව, අනුමත කාර්යමණ්ඩලයෙන් සියයට 40ක ප්‍රමාණයක පුරප්පාඩුව පැවතුණි.

(ආ) ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරු 12ක්, අධ්‍යක්ෂ(පාලන) තනතුර, පුස්තකාලයාධිපති තනතුර, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුර යන තනතුරු 2024 දෙසැම්බර් 31 වන විට පුරප්පාඩුව පැවතුණි.

(ඇ) සංස්කාරක තනතුරු සඳහා පුරප්පාඩු 07ක් ද, ලේඛන සහකාර තනතුරු සඳහා පුරප්පාඩු 11ක් ද, ප්‍රධාන භාෂා පරිවර්තක තනතුර සඳහා පුරප්පාඩු 01ක් ද, සංවර්ධන නිලධාරි තනතුර සඳහා පුරප්පාඩු 01ක් ද, භාෂා පරිවර්තක තනතුරු සඳහා පුරප්පාඩු 08ක් ද, රියදුරු තනතුර සඳහා පුරප්පාඩු 03ක් ද, කළමනාකරණ සේවා නිලධාරි තනතුර සඳහා පුරප්පාඩු 04ක් ද, වශයෙන් දෙපාර්තමේන්තුවට අත්‍යාවශ්‍ය තනතුරු 35ක ප්‍රමාණයක් පුරප්පාඩුව පැවතුණි.

යූ.එන් අලුත්ගේ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට (වැ.බ)

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශකය (ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව)

<table>
<tr><td colspan="6" rowspan="2">විශේෂිත දර්ශක</td><td colspan="3">අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම</td></tr>
<tr><td>100% - 90%</td><td>75% - 89%</td><td>50% - 74%</td></tr>
<tr><td>රාජකාරියේ ස්වභාවය</td><td>ලැබී ඇති ඉල්ලීම් (පසුගිය වර්ෂයේ අවසන් නොවූ ඉල්ලීම් ද ඇතුළත්ව)</td><td>2024.12.31 දිනට කෙටුම්පත් සකස් කර භාෂාත්‍රයෙන් අදාළ පාර්ශ්වයන් වෙත ලබා දුන් සංඛ්‍යාව (කිහිපවරක් භාෂාත්‍රයෙන් සකස් කර අදාළ පාර්ශ්වයන් වෙත භාරදුන් අවසන් කෙටුම්පත්වල ඒ ඒ වාරයන් සියල්ලම මෙහි ඇතුළත් වේ.)</td><td>දීර්ඝ කාලීනව උපදෙස් නොමැතිව වසන ලද ගොනු</td><td>2024.12.31 දිනට කෙටුම්පත් කර මූලික හෝ අවසන් කෙටුම්පත් වශයෙන් භාරදී නීතිපති හෝ අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් නිරීක්ෂණ හා උපදෙස් බලාපොරොත්තු වෙන් ඉතිරිව පවතින ඉල්ලීම් සංඛ්‍යාව</td><td>2024.12.31 දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් සංඛ්‍යාව</td><td colspan="3" rowspan="5">දෙපාර්තමේන්තුව විසින් අවධානය යොමුකර සම්පූර්ණ කරනු ලැබ කෙටුම්පත් යවනු ලැබුවාවූ ඉල්ලීමක්,ප්‍රධාන වශයෙන් උපදෙස් ලබාදෙනු ලබන නියෝජ්‍යායතන විසින් තම ප්‍රතිපත්තිය නිරන්තරයෙන් වෙනස් කිරීමේ හේතුව මත,තවදුරටත් වූ සංශෝධන සඳහා අලුත් උපදෙස් ද සමග ඉදිරිපත් කරනු ලැබේ. එසේ වුවද එවැනි ඉල්ලීමක් ලැබුන විට එම ඉල්ලීමට අදාළ කෙටුම්පත අවසාන වශයෙන් සකස් කර තිබීම නොසලකා අලුතින් සිදුකරනු ලබන ඉල්ලීමක් සඳහා මෙන් එම ඉල්ලීම පිළිබඳව නැවත අවධානය යොමු කිරීමට හා කාලය වැය කිරීමට මෙම දෙපාර්තමේන්තුවට සිදු වේ. තවද, සම්පූර්ණ කරන ලද කෙටුම්පත් සඳහා එවැනි සංශෝධන සිදුකිරීමට කරනු ලබන ඉල්ලීම් අවසාන කෙටුම්පත භාෂාත්‍රයෙන් යවනු ලැබීමෙන් පසුවද සිදු කරනු ලබන අතර ඇතැම්විට එම කාර්ය පටිපාටිය නැවත නැවතත් වාර ගණනක් ඉටු කිරීමට සිදුවේ.</td></tr>
<tr><td>පනත් කෙටුම්පත් කිරීම (මූලික හා සංශෝධන නීති)</td><td>250</td><td>60</td><td>25</td><td>162</td><td>3</td></tr>
<tr><td>පෞද්ගලික මන්ත්‍රී (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත්</td><td>57</td><td>8</td><td>49</td><td>-</td><td>-</td></tr>
<tr><td>උපකාරක නීති ප්‍රතිශෝධනය</td><td>330</td><td>124</td><td>17</td><td>147</td><td>42</td></tr>
<tr><td>පළාත් සභා ප්‍රඥප්ති</td><td>11</td><td>-</td><td>4</td><td>7</td><td>-</td></tr>
</table>

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණ (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණ දක්වන්න.

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
16.1			ලැබී ඇති ඉල්ලීම් අනුව ඉටු කර ඇත.		
16.2					
16.3					
16.4					
16.5					

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

තිරසර අරමුණු අනුව කටයුතු කරනු ලබන අතර, උපරිම කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායිතාව ලබා ගැනීමට හැකි අයුරින් දෙපාර්තමේන්තුව විසින්, ආණ්ඩුවේ විවිධ අමාත්‍යාංශවලින් ඉදිරිපත් කරන නව නීති පැනවීම සඳහා පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම, පවත්නා නීති සංශෝධනය කිරීමේ පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම සහ උපකාරක නීති ප්‍රතිශෝධනය කිරීම සිදුකර ඇත. පනත් කෙටුම්පත් සමාලෝචනය කිරීම සඳහා වන පාර්ලිමේන්තු තේරීම් කාරක සභා රැස්වීම්වලට සහභාගීවීම සහ පනත් කෙටුම්පත් විවාදයට ගැනීමේදී පාර්ලිමේන්තුව සමග සම්බන්ධීකරණය පවත්වා ගැනීම වැනි අවශ්‍ය කටයුතු කිරීම දනිසි පරිදි ඉටු කර ඇත.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	**47**	**23**	**24**
තෘතීය	**28**	**19**	**09**
ද්විතීය	**55**	**30**	**25**
ප්‍රාථමික	**24**	**20**	**04**

6.2

දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය භාරය කිරීම සඳහා වන අනුමත සේවක සංඛ්‍යාව 154 කි. එසේ වුවද, එකී කටයුතු ඉටු කිරීම සඳහා 2024 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ තත්‍ය සේවක සංඛ්‍යාව වූයේ 92 දෙනෙකු පමණි. ඉහත දක්වා ඇති පරිදි, විවිධ සේවා ගණවල සේවා නියුක්තිය සම්බන්ධයෙන් පුරප්පාඩු 62ක් පවතියි. මෙම පුරප්පාඩු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනයට සෘජුවම බලපානු ලබන හෙයින් එකී බලපෑම් අවම කිරීම සඳහා පහත දැක්වෙන පියවර ගෙන ඇත.

ජ්‍යෙෂ්ඨ මට්ටම

(අ) 2024.12.31 දිනට නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක තනතුරු 03ක් පුරප්පාඩුව පවතී.

(ආ) ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරෙහි පුරප්පාඩු 12 ක් පවතියි. අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව, එකී පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා දැනට සේවයේ යෙදී සිටින සහකාර නීති කෙටුම්පත් සම්පාදකවරුන් විසින් එකී නියමිත වසර දහයක සේවා කාලය සම්පූර්ණ කළ යුතු වන අතර 2021.02.21 දිනට සහකාර නීති කෙටුම්පත් සම්පාදකවරුන් 14 දෙනෙකු එම සුදුසුකම් සම්පූර්ණ කර ඇත. ඒ අනුව අදාළ පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතියි.

(ඇ) සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරෙහි පුරප්පාඩු 07 ක් පවතියි. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට අදාල තරඟ විභාගය 2023.11.11 දින පවත්වන ලද අතර එම විභාග ප්‍රතිඵල අනුව සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු සිදු කරමින් පවතී.

(ඇ) සහකාර අධ්‍යක්ෂ තනතුරේ සේවය කරන ලද නිලධාරිනිය ස්ථාන මාරු සඳහා ඉල්ලීම් කරන ලද අවස්ථාවලදී සුදුසු අනුප්‍රාප්තිකයෙකු ලබා දෙන ලෙස 2022.06.10 සහ 2022.12.01 දිනැති ලිපි මගින් අධිකරණ අමතයාංශය මගින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දී ඇත. අධිකරණ අමාත්‍යාංශයේ සහකාර ලේකම් තනතුරේ සේවය කරනු ලබන නිලධාරීනියක් 2023.08.10 දින සිට සහකාර අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීම සඳහා අනුයුක්ත කර ඇත.

තෘතීය මට්ටම

(අ) 2023.12.31 වන දිනට ප්‍රධාන භාෂා පරිවර්තක තනතුරක් සහ භාෂා පරිවර්තක තනතුරු 16 ක් පුරප්පාඩුව පවතියි. එනම්, ඉංග්‍රීසි/ සිංහල භාෂා පරිවර්තක තනතුරු 08 ක් සහ ඉංග්‍රීසි/ දෙමළ භාෂා පරිවර්තක තනතුරු 08 ක් වේ. මෙම තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීමට අදාල තරඟ විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2023.12.23 දින පවත්වන ලද අතර එම විභාග ප්‍රතිඵල අනුව භාෂා පරිවර්තක ඉංග්‍රීසි/සිංහල තනතුරු 05 ක් හා ඉංග්‍රීසි/දෙමළ තනතුරු 05 ක් ලෙස පත්වීම් ලබා දෙන අතර ඉංග්‍රීසි/සිංහල 03 ක් හා ඉංග්‍රීසි/සිංහල 03 ක් ලෙස තනතුරු 06 ක් පුරප්පාඩුව පවතී. වැටුප් ක්‍රමයෙහි ඇති විෂමතා හේතුවෙන් නිලධාරීන් මෙම තනතුරෙහි රඳවා ගැනීම අසීරු වී ඇත.අමප/23/1636/614/037-Iහා 2023.09.11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා පත්කළ කමිටුව මගින් ලබා දී ඇති නිර්දේශ අනුව භාෂා අධිකාරි හා භාෂා පරිවර්තක තනතුරුවලට අදාලව අවශ්‍ය අනුමැතීන් ලබා ගෙන ඉදිරි කටයුතු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. එමෙන්ම වසරක කාලයක් සඳහා භාෂා පරිවර්තනය පිළිබඳ උපාධිධාරීන් 07 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලද අතර 2024.12.01 දක්වා ඉන් තිදෙනෙකුගේ සේවය ලබා ගන්නා ලදී.

ද්විතීයික මට්ටම

(අ) 2020.04.14 දින සිට පුස්තකාලයාධිපති තනතුර පුරප්පාඩුව පවතී. 2022.06.22 හා 2022.09.26 දිනැති ලිපි මඟින් මෙම පුරප්පාඩුව පිළිබඳව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කර ඇත.

(ආ) අනුමත කරන ලද දින (2021.06.18) සිට පුරප්පාඩුව පවතින තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුර සඳහා සුදුසු නිලධරයෙකු පත් කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කර දෙන ලෙස 2022.09.28 හා 2023.02.16 දිනැතිව අධිකරණ අමාත්‍යාංශය මගින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීම් කර ඇත. නමුත් මේ වන තෙක් එම තනතුර පුරප්පාඩුව පවතී.

(ඇ) 2024.12.31 දිනට කළමනාකරණ සේවා නිලධාරි තනතුරෙහි පුරප්පාඩු 04 ක් පවති. 2024.11.29 දිනැති ලිපිය මගින් අවසන් වරට මෙම පුරප්පාඩුව පිළිබඳව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කර ඇත.

(ඈ) 2024.12.31 වන දිනට ලේඛන සහකාර තනතුරෙහි පුරප්පාඩු 11 ක් ද, සංස්කාරක තනතුරෙහි පුරප්පාඩු 07 ක් ද පවතියි. අයදුම්පත් කැඳවා අවසන් කර ඇතත්, අයවැය චක්‍රලේඛ 03/2022 හේතුවෙන් බඳවා ගැනීම් තාවකාලිකව නතර කර ඇත. පුරප්පාඩුව පවතින තනතුරු සංඛ්‍යාවට වඩා අඩු තනතුරු සංඛ්‍යාවක් සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් වන කමිටුවේ අනුමතය ලබා දී ඇති නමුත් සියලුම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීම අවශ්‍ය බැවින් ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීම් කර ඇත.
ඊට සමගාමීව විභාගය පැවැත්වීමට අවශ්‍ය කටයුතු ශ්‍රී ලංකා සංවර්ධන හා පරිපාලන ආයතනය සමග සිදු කරමින් පවතී.

<u>ප්‍රාථමික මට්ටම</u>

(අ) රියදුරු තනතුරේ පුරප්පාඩු 03 ක් පවතී. මේ සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කර ඇත. 2024.07.29 දිනැතිව උක්ත පුරප්පාඩු පිරවීමට කටයුතු කරන ලෙස අධිකරණ අමාත්‍යාංශ ලේකම් මගින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීම් කර ඇත.

(ආ) කාර්යාල සේවක සේවය තනතුරේ පුරප්පාඩු 1 ක් පවතී.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කළ කාර්ය මණ්ඩල සංඛ්‍යාව	වැඩසටහන පැවති කාලසීමාව	මුළු ආයෝජනය(රු’000)		වැඩසටහන් ස්වභාවය (විදේශීය/ දේශීය)	ලබාගත් ප්‍රතිඵලය/ දැනුම
			දේශීය	විදේශීය		
Workshop on Preventing Illicit Transfer to Chemicals - Netherland	01	2024 මාර්තු 18 සිට මාර්තු 21 දක්වා		එ.ජ. ඩොලර්150	විදේශීය	
Seminar On Anti-Monopoly Law Enforcement For Bri Partner Countries - China	01	2024 ජූනි 12 සිට ජූනි 25 දක්වා		එ.ජ. ඩොලර් 375	විදේශීය	
Commercial Law Development Program (CLDP) - Washington, DC, USA	01	2024 ජූනි 24 සිට ජූනි 27 දක්වා		එ.ජ. ඩොලර් 320	විදේශීය	
International Association of Privacy Professionals (IAPP's) Asia Privacy Forum - Singapore	01	2024 ජූලි 15 සිට ජූලි 19 දක්වා		එ.ජ. ඩොලර් 175	විදේශීය	
Seminar on Tourism Resources Exploitation and Environmental Protection in Developing Countries - China	01	2024 අගෝස්තු 29 සිට සැප්තැම්බර් 11 දක්වා		එ.ජ. ඩොලර් 375	විදේශීය	

Seminar on E-commerce Standardization Cooperation between China and South Asian Countries - China	01	2024 අගෝස්තු 29 සිට සැප්තැම්බර් 11 දක්වා		එ.ජ. ඩොලර් 375	විදේශීය	
Master of Philosophy in Law (M.Phil.) Programme-2024	01	2024/2026	රු. 7,20,000.00	-	දේශීය	
ආයතන සංග්‍රහයේ විධිවිධාන හා පටිපාටික රීති භාවිතය පිළබඳ වැඩමුළුව- SDFL ආයතනය	01	2024.07.08 හා 09	රු.13,000.00	-	දේශීය	
විදේශ පුහුණු කටයුතු සඳහා නිවාඩු හා දීමනා ලබා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳ වැඩමුළුව - SDFL ආයතනය	01	2024.08.02	රු.7000.00	-	දේශීය	
විද්‍යාත්මක,පිරිමැසුම්දායක සහ ආරක්ෂිත රිය පැදවීම පිළබඳ වැඩමුළුව- ඉදිකිරීම කර්මාන්ත සංවර්ධන අධිකාරිය	02	2024.08.27	රු. 12,000.00	-	දේශීය	
වැටුප් පරිවර්තන පුහුණුව - නීතිපති දෙපාර්තමේන්තුව	04	2024.07.11,හා 12	රු.20,000.00	-	දේශීය	
පැය 150 සිංහල භාෂා පුහුණු පාඨමාලාව-NILET	01	2024.05.08-2024.08.03	රු.10,000.00	-	දේශීය	

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)			
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	මෙම ගිණුම් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට අදාළ නොවේ.		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්			
1.6	වෙනත්			
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්නවාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.4	අභ්‍යන්තර විගනන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිනුම් සාරාංශ (CIGAS) පිලියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රේ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		

3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොමැත. අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් විගණන කටයුතු ඉටු කරයි.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේනතුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණනය**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2)DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොමැත. අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් විගණන කටයුතු ඉටු කරයි.		

6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උපවගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොමැත. අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් විගණන කටයුතු ඉටු කරයි.		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම			
7	**විගණන හා කළමනාකරන කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		

8.3	රාජ්‍ය මුදල් චක්‍රලේක අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය කිරීම**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරනය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරික්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		

10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් අතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදනය හා උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට අදාළ අත්තිකාරම් ගිණුමෙහි හිඟ හිටි ණය ශේෂ කිසිවක් නොමැත.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම			

13	**පොදු තැන්පත් ගිණුම්**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට අදාළ පොදු තැන්පතු ගිණුමෙහි කල් ඉකුත් වූ තැන්පතු නොමැත.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිනුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15.	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට ආදායම් ගිණුම අදාළ නොවේ.		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම			
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබී			

16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අදාළ නොවේ		

18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අදාළ නොවේ		
19	**මානව සම්පත් සංවර්ධන සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සංවර්ධන සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ	කාර්ය මණ්ඩලය වෙත අවශ්‍ය පුහුණු ලබා දී ඇත.	
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල නොවේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින්පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		